④ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2057/26 - 2018 පෙබරවාරි මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2018.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/21/28/2009

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.06.11 දිනැති හා අංක 1762/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.06.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 301 හි පිහිටි ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කැළණිය, වේවැල්දූව, අංක 130 හි පිහිටි පැක්සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.10.25 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජනවාරි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මගේ අංකය : IR/21/28/2009

### කාර්මික අධිකරණයේ දී ය.

ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය,
අංක 301, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

නඩු අංකය : A 3454 — *පළමු පාර්ශ්වය*

සහ

පැක්සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක 130, වේවැල්දූව,
කැළණිය.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල

### ප්‍රදානය

වැඩබලන කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය ආචාර්ය ජගත් බාලසූරිය මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 04 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2012.06.06 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

*ආරාවුලට තුඩුදුන් කාරණය*

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් වී. බී. පී. කේ. වීරසිංහ මහත්මිය විසින් 2012.05.11 දින එවා ඇති ලිපියේ දක්වෙන්නේ,

පැක්සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් මෙහි පහත නම් සඳහන් සේවකයින් විසි අට (28) දෙනා එම සමාගමේ සේවය අතහැර ගියා සේ සැලකීම යුක්තිසහගතද යන්න සහ යුක්තිසහගත නොවේ නම්, ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව ද වේ.

01. එල්. ඩී. නිශාන්ත
02. ඩබ්. එම්. නිමල් නිව්ටන් බණ්ඩාර
03. කේ. ඩී. සුනිල්
04. එස්. ඒ. චමින්ද ජගත් කුමාර
05. ඒ. සී. පීරිස්
06. කේ. ටී. සී. ගෝමස්
07. කේ. ඩී. යූ. ආර්. පුෂ්පකුමාර
08. ඒ. කේ. රංජිත් මහේෂ් පෙරේරා
09. ඩබ්ලිව්. ශාන්ත
10. එම්. රාජිත ගුණතිලක

1 A – G 27078 — 28 (2018/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

11. එස්. ඒ. රසික නාමල් වික්‍රමරත්න
12. ආර්. ඒ. රංජිත් නිශාන්ත
13. එස්. පී. ප්‍රියන්ත චන්ද්‍රසිරි
14. ජේ. ඒ. ඒ. ඒ. ජයසිංහ
15. පී. ඒ. සිසිර කුමාර කරුණාරත්න
16. ඩී. එච්. අසෝක එදිරිසිංහ
17. එස්. එම්. ක්‍රිෂාන්ත චන්ද්‍රසිරි වික්‍රමසිංහ
18. ඩබ්. එම්. ධම්මික පුෂ්ප කුමාර
19. යූ. ආර්. විජේසේකර බණ්ඩාර
20. ඩබ්ලිව්. මනෝජ් ප්‍රියංකර සිල්වා
21. සී. එච්. විජිත කුමාර
22. ආර්. ඒ. ඩී. සුරංග රුවන් කුමාර
23. සී. එම්. ජයකොඩි
24. එම්. ඒ. ලසන්ත මංගල
25. ඒ. ඒ. සුරේෂ් රංජන
26. ඩී. එම්. ධනුෂ්ක සංජීව දිසානායක
27. ආර්. එම්. සම්පත් දිනේෂ් රත්නායක
28. ඩී. පී. දිනේෂ් වෙදගෙදර

### පසුබිම

ඉල්ලුම්කාර සමාගම විසින් 2012.06.25 වන දින පිටපත් තුනකින් සමන්විත පළවෙනි විස්තර ප්‍රකාශය 2012.07.23 වන දින වගඋත්තරකරුවන් විසින් ප්‍රතික්ෂේප කර දන්වන ලදී. වර්ෂ 2012.08.06 වන දින මා ඉදිරිපිට දී විභාගයට ගත් අවස්ථාවේදී ඉල්ලුම්කාර පක්ෂය වෙනුවෙන් නීතිඥ එච්. ඒ. සෙනෙවිරත්න මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් නීතිඥ එම්. බී. ජයසිංහ මහතා පෙනී සිටින ලදී. එම අවස්ථාවේදී නීතිඥ එච්. ඒ. සෙනෙවිරත්න මහතා දක්වා සිටියේ මෙම නඩුව A 3313 දරන අංකය යටතේ විභාග වෙමින් පවතිද්දී එවකට බේරුම්කරු වූ වී. අයි. ජයසූරිය මහතා අභාවප්‍රාප්ත වූ බැවින් A 3454 අංකය යටතේ ඔබතුමා පත් කර ඇති බවත් වග උත්තරකරුවන්ගේ පළමු ප්‍රකාශය $X_1$ සිට $X_{13}$ දක්වා වූ ලේඛන සමග අමුණා ඇති බැවින් එකී ලේඛන නිශ්චිතව පරීක්ෂා කිරීමෙන් පසු දෙවන ප්‍රකාශය ඉදිරිපත් කරන බවත්, දන්වන ලදී. මේ අවස්ථාවේදී වග උත්තරකාර පක්ෂය දෙවන ප්‍රකාශය ද ඉදිරිපත් කරන ලදී. 2012.09.26 වන දින නැවත විමසීමට ගත් අවස්ථාවේදී ඉල්ලුම්කරුවන් වෙනුවෙන් 2012.09.24 වන දින දෙවන ප්‍රකාශය ගොනු කර ඇති බවත් ප්‍රකාශ කරමින් පිටපත වගඋත්තරකාර නීතිඥ මහතා වෙත භාර දෙන ලදී. විශේෂයෙන් පූර්වගාමී බේරුම්කරු වන ආචාර්ය ඩී. අයි. ජයසූරිය මහතා ඉදිරියේ දී දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කළ කරුණු සලකා බැලීමෙන් පසු සේවකයින් 28 දෙනාට හිමි රැකියාව ලබාදී වැටුප 5% කින් වැඩිවීමත් ගෙවීමට හැකි ද යන්න යෝජනා වූ බවත්, මේ අවස්ථාවේදී ද එම යෝජනාව සලකා බැලීම සුදුසු බව දැන්වූවද වග උත්තරකාර නීතිඥ මහතා නැවත රැකියාව ලබාදී ම කළ නොහැකි බවට දැන්වීය.

මීළඟ දිනයට පෙර ඉල්ලුම්කාර පාර්ශ්වයේ යෝජනාව වගඋත්තරකාර පක්ෂය වෙත නැවත දන්වා ඒ සම්බන්ධව ලිඛිත උපදෙස් ඉදිරිපත් කිරීමෙන් පසුව සමථය හෝ විභාග සඳහා 2012.10.19 දින නැවත විමසීම ආරම්භ කරන ලදී. මේ අවස්ථාවේදී දෙපාර්ශ්වයම නැවත නඩු විභාගය ආරම්භ කිරීම සුදුසු බව දන්වන ලදී.

වර්ෂ 2012.11.23 වන දින විභාගයට ගත් අවස්ථාවේදී ඉල්ලුම්කාර පක්ෂය මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කිරීමට යෝජනා කරන ලද අතර වගඋත්තරකාර පක්ෂය ද එකී ඉල්ලීම සාධාරණ බවත් ඒ සම්බන්ධයෙන් බේරුම්කරණයේ නියෝගය පිළිගන්නා බවත් දැන්වීය. ඒ අනුව 2012.12.20 වන දින සහිතව පිටු 06 කින් සමන්විත දිවුරුම් ප්‍රකාශයක් ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය රණවක ආරච්චිගේ රංජිත් නිශාන්ත යන අය විසින් ගොනු කරන ලදී.

වර්ෂ 2013.01.29 වන දින රණවක ආරච්චිගේ රංජිත් නිශාන්ත මූලික සාක්ෂි දෙමින් දිවුරුම් ප්‍රකාශය සඳහන් $A_1$ සිට $A_{22}$ දක්වා ලේඛන ලකුණු කරමින් මූලික ප්‍රශ්න අවසන් කරන ලද අතර එදිනම වගඋත්තරකරුවන් වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කරන ලදී. ඒ අනුව 2013.01.29, 2013.02.26, 2013.05.29, 2013.06.17 යන දින වලදී හරස් ප්‍රශ්න අසන ලද අතර ඉල්ලුම්කාර පක්ෂය විසින් 2013.09.20 වන දින ඉල්ලුම්කරු වෙනුවෙන් නැවත ප්‍රශ්න අසන ලදී. 2013.10.22 වන දින චින්තාමනී හෙට්ටිගේ විජිත කුමාර යන නව සාක්ෂිකරු ඉල්ලුම්කරු වෙනුවෙන් කැඳවන ලදී.

වර්ෂ 2014.01.17 වන දින හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කරන ලදී. 2014.02.19 වන දින ද හරස් ප්‍රශ්න අසන ලද අතර 2014.03.21 වන දින නැවත ප්‍රශ්න අසන ලදී. 2014.05.12 වන දින නැවත ප්‍රශ්න අවසන් කරමින් A1 සිට A32 දක්වා ලේඛන ලකුණු කරමින් ඉල්ලුම්කරුගේ නඩුව අවසන් කරන ලදී.

2014.06.13 වන දින වගඋත්තරකරුවන්ගේ නඩුව නීතිඥ කේ. බී. සමන් ප්‍රියලාල් මහතා විසින් ආරම්භ කරන ලදී. වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් කළමනාකාර අධ්‍යක්ෂ අම්බලන්ගොඩ ලියනගේ අතුලජයන්ත ද සිල්වා 2014.07.22 දින සහ 2014.10.03 වන දින ද මූලික සාක්ෂි විමසන අතර එදිනම ඉල්ලුම්කරුවන් වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කරන ලදී. 2015.01.23 වන දින හරස් ප්‍රශ්න අවසන් වූ පසු නැවත ප්‍රශ්න නොඅසන ලද අතර 2015.03.09 වන දින නව සාක්ෂිකරුවෙකු කැඳවන ලද අතර එදින මූලික ප්‍රශ්න අවසන් වීමෙන් පසු හරස් ප්‍රශ්න ද අසා නැවත ප්‍රශ්න ඇසීමෙන් පසු තවත් සාක්ෂිකරුවෙක් කැඳවීමට අවසර ලබාගෙන 2015.05.26 වන දින මූලික ප්‍රශ්න අවසන් කරන ලද අතර 2015.08.04 වන දින හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රශ්න අසා අවසන් කරන ලදී.

2015.09.01 වන දින වග උත්තරකාර සමාගමේ බොයිලේරු ඔපරේටරයෙකු වන ගලප්පත්ති හේවගේ ප්‍රියන්ත ලක්මාල් මූලික සාක්ෂි දෙන ලද අතර හරස් ප්‍රශ්න ඇසීම ද ආරම්භ කරන ලදී. එදිනම නැවත ප්‍රශ්න අසා අවසන් කරන ලද අතර 2015.10.16 වන දින දික්පිටිය විතානගේ දයාරත්න යන, වික්‍රමසිංහ සහ දයානන්ද සමාගමේ හවුල්කරුවෙකු සාක්ෂියට කැඳවන ලදී. 2015.11.03 වන දින සාක්ෂිකරුගේ හරස් ප්‍රශ්න අසන ලද අතර 2016.03.16 වන දින දෙපාර්ශ්වය විසින් ම ලිඛිත දේශන සඳහා දින ලබාගත් අතර 2016.06.21 වන දින ඉල්ලුම්කරු විසින් ලිඛිත දේශන ගොනු කරන ලද අතර වගඋත්තරකරුවන් වෙනුවෙන් ලිඛිත දේශන ගොනු කර නොමැති බව ලිපිගොනුව පරීක්ෂා කිරීමෙන් පෙනී යයි.

මෙම නඩුවේ ආරවුල වන්නේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් ගත් සේවකයන් පදනමකින් තොරව සේවයෙන් පහ කළේ යන චෝදනාවයි. දෙපාර්ශ්වය අතර වරින් වර සමගි ගිවිසුම් ඇති කරගත් බව නඩු විභාගයේ දී මෙන්ම ගොනුව පරීක්ෂා කිරීමේදී ද තහවුරු වේ. වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය ගනු ලැබුවේ සේව්‍ය පක්ෂය විසින් නීත්‍යානුකූලව සැපයිය යුතු සේවාවන් කප්පාදු කිරීම හේතුවත් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය ආරම්භ කිරීමේ හේතුවත් නිසා බැව් පෙනේ.

මෙම නඩුවට පරිබාහිරව වර්ජනය පැවතෙද්දී ලෙනින් ජයසිංහ මහතා ගමන් කළ මෝටර් රථයට අවහිරතා සහ පාඩු කලේ යන පදනම යටතේ කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ සේවකයන් තිදෙනෙකුට විරුද්ධව අංක 52796/3 යටතේ අපරාධ චෝදනා තුනක් නගන ලද අතර පූර්ණ නඩු විභාගයකින් අනතුරුව ගරු මහේස්ත්‍රාත්තුමා විසින් සියලු චූදිතයන් නිදොස් කර නිදහස් කරන ලදී. නඩු විභාගයේ දී නඩු වාර්තාව A24 ලෙසත් තීන්දුවේ අවසන් කොටස A27(අ) ලෙසත් ලකුණු කරන ලදී. එකී නඩුවෙන් චූදිත සේවකයන් නිදොස් කොට නිදහස් කරන ලදී. මෙම නඩුවේ දී විශේෂයෙන් සලකා බැලිය යුත්තේ ආචාර්ය ඩබ්. අයි. ජයසූරිය මහතා ඉදිරියේදී වෙනත් අංකයක් යටතේ පවත්වන ලද නඩු විභාගය ඒ මහතාගේ අභාවය නිසා නැවතත් මාවෙත යොමු කරන ලද බවයි. එම යොමු කිරීමේදී A1 සිට A22 දක්වා ලේඛන ලකුණු කරන ලද අතර මූලික සාක්ෂි වලදී A32 දක්වා වූ ලේඛන ද අලුතෙන් ලකුණු කරන ලදී.

වගඋත්තරකරුවන්ගේ ස්ථාවරය වන්නේ සේවකයන් වගඋත්තරකාර සමාගමට අලාභ හා පාඩු කිරීමේ චේතනාවෙන් පදනම් විරහිතව වැඩ වර්ජනයක් ආරම්භ කළ බවයි. එසේම වැඩ වර්ජනය නිසා මෙන්ම සේවකයන්ගේ කඩාකප්පල්කාරී ක්‍රියාවන් නිසා සමාගමට දැඩි අලාභානි සිදු වූ බවට සාක්ෂි මෙහෙයවීමට උත්සාහ කරන ලදී. විශේෂයෙන් කර්මාන්තශාලාවේ ක්‍රියාකාරී බ්‍රොයිලේරු වලට අනවශ්‍ය ද්‍රව්‍ය දමා කාර්යක්ෂමතාවය අඩපණ කළ බවට ද සාක්ෂි මෙහෙයවීමට උත්සාහ කරන ලදී.

ඉල්ලුම්කරුවන්ගේ ස්ථාවරය වන්නේ 2009.06.02 වන දින පූර්ව දැනුම් දීමකින් පසු ශ්‍රී ලංකා නිදහස් සේවක සංගම් ශාඛාවේ සමස්ත සාමාජික පිරිස හා එම ශාඛාවේ නිලධාරීන් සියලු දෙනා වැඩ වර්ජනයක් කළ බවත්, එකී වැඩ වර්ජනයට පාදක වූයේ පැමිණිලිකරුවන් සහ වගඋත්තරකරු අතර 2007.02.01 දින සිට 2009.01.31 දින තෙක් ඇති කර ගත් සාමූහික ගිවිසුම අවසන් වීමෙන් පසු නැවතත් කරන ලද ඉල්ලීම් පැහැර හැරීමත්, 2008.12.15 වන වගඋත්තරකරු වෙත සේවක ප්‍රශ්න සම්බන්ධයෙන් කරන ලද ලිඛිත ඉල්ලීමට ප්‍රතිචාර නොදැක්වීමත්ය.

2009.08.06 වන දින වගඋත්තරකරු 2009.08.14 වන දින සේවයට වාර්තා කරන ලෙස සේවකයන් වෙත වෙන් වෙන්ව දන්වා තිබූ අතර සේවකයන් වෙන් වෙන් වශයෙන් 2009.08.10 දින දරන ලිපි මඟින් වර්ජනය අවසන් වන තුරු සේවයට පැමිණිය නොහැකි බව දන්වන ලදී.

ඊට ප්‍රතිචාරයක් ලෙස 2009.08.19 දිනැති ලිපියෙන් එම සේවකයන් 2009.08.14 වන දින සිට සිය කැමැත්තෙන් සේවය අත්හැර ගිය බවට සලකන බවට දන්වන ලදී. වගඋත්තරකාර පක්ෂය සේවකයන්ට හෝ පැමිණිලිකාර සංගමයට නොදන්වා සේවකයන්ට විරුද්ධව නීති විරෝධී ලෙස රංචු ගැසීම යන පදනමින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයෙන් නියෝගයක් ලබා ගත් බව පසුව දැනගන්නට ලැබුණි.

ඉල්ලුම්කරු වෙනුවෙන් රණවක ආරච්චිගේ රංජිත් නිශාන්ත විමසීම ආරම්භයේදීම පෙර සඳහන් කරන ලද ලේඛන ලකුණු කරමින් මූලික සාක්ෂි අවසන් කළ අතර වගඋත්තරකාර පක්ෂය නොකඩවා දින පහක් පමණ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් විශේෂයෙන්ම අවධාරණය කළේ සමාගම සාමූහික ගිවිසුම් අත්සන් කර තිබුණත් ඒවා නිරන්තරයෙන් කඩ කිරීම පුරුද්දක් වශයෙන් සිදු කළ බවයි.

නිවාඩු සම්බන්ධයෙන් මෙන්ම දීමනා සම්බන්ධයෙන් ද පැහැදිලි ප්‍රතිපත්තියක් අනුගමනය නොකළ බවත් අවධාරණය කරන ලදී. විශේෂයෙන්ම වෘත්තීය සමිති අයිතිවාසිකම් සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලක් නොදැක්වූ බව අවධාරණය කරන ලදී.

ඉල්ලුම්කාර පක්ෂය වෙනුවෙන් චින්තාමනි හෙට්ටිගේ විජිත කුමාර මූලික සාක්ෂියේදී මුලින් සාක්ෂිදුන් සාක්ෂිකරුගේ සම්පූර්ණ සාක්ෂි අවධාරණය කරමින් විශේෂයෙන් සඳහන් කළේ වැඩ වර්ජනයට සහභාගි වූ වෘත්තීය සමිති නිලධාරීන්ට විරුද්ධව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ අපරාධ නඩුවක් පවරා දීර්ඝ නඩු විභාගයකින් පසුව විත්තිකරුවන් නිදෙස් කොට නිදහස් කරන ලද බවයි.

මෙම සාක්ෂිකරුද දීර්ඝ ලෙස හරස් ප්‍රශ්න වලට භාජනය වූ අතර ආයතනයේ පවතින යථා තත්වය සම්බන්ධයෙන් පැහැදිලි කරන ලද අතර, සාක්ෂිකරුවන් දෙදෙනා අතර හෝ සාක්ෂි පිළිබඳව පරස්පර විරෝධතාවයක් මතු නොවුනි.

A1 සිට A32 දක්වා ලේඛන ලකුණු කරමින් ඉල්ලුම්කරුවන්ගේ නඩුව අවසන් කරන ලදී.

2014.06.13 දින වගඋත්තරකරුවන්ගේ නඩුව ආරම්භ කරන ලද අතර වගඋත්තරකරුවන් වෙනුවෙන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ අම්බලන්ගොඩ ලියනගේ අතුල ජයන්ත ද සිල්වා සාක්ෂි දෙමින් අවධාරණය කළේ වෘත්තීය සමිතිය යෝජනා කරන ලද වැටුප් වැඩි වීම ක්‍රියාත්මක කිරීමට නොහැකි වූයේ මූල්‍ය අර්බුදය නිසා සමාන්තර සමාගම් 14 වසා දැමීමට සිදු වූ බවත් 35% ක වැටුප් වැඩි වීමත් සමග නිෂ්පාදන ඉලක්කය වැඩි කළහොත් සේවකයන්ට විශේෂ දීමනාවන් දිය හැකි බවට කරුණු දක්වන ලදී.

විශේෂයෙන්ම 2014.07.22 වන දින මූලික සාක්ෂි 17 වන පිටුවේ දී උත්තරය ලෙස සඳහන් කර ඇත්තේ වර්ජනයට පෙර මැෂින් වලට අලාභානි කළ බවත්, යන්ත්‍රෝපකරණ කොටස් විනාශයට පත් වී තිබුණ බවත් සඳහන් කරන ලදී.

විශේෂයෙන්ම මෙම විමසීමේදී දින ගණනාවක් හරස් ප්‍රශ්න වලට භාජනය කළද ඉල්ලුම්කරුවන්ගෙන් මේ සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් හෝ ඉඟියක් හෝ නොඅසන ලද අතර මුල් වතාවට වගඋත්තරකාර පක්ෂයේ මූලික සාක්ෂියේදී සඳහන් කිරීම අසාමාන්‍ය සිදුවීමකි.

මෙම සාක්ෂිකරු නිශ්චිත ස්ථාවරයකින් සාක්ෂි නොදෙන බව වඩාත් පැහැදිලි වන්නේ ඔහුගේ ප්‍රකාශ තහවුරු කිරීමට අසමත් වන නිසාය. වර්ජනය නිසා නව සේවකයන් බඳවා ගත් බව සාක්ෂිකරු මූලික ප්‍රශ්න වලදී අවධාරණය කරන ලදී.

විශේෂයෙන්ම මෙම සාක්ෂිකරු පඩි වැඩි කිරීමකට වඩා නිෂ්පාදනය වැඩි කිරීමේ අභිලාෂයෙන් සේවකයන්ට දිරිගැන්වීමේ විකල්ප යෝජනාවක් ඉදිරිපත් කළද එය අවසන් වන දිනයක් හෝ ඒ සම්බන්ධයෙන් සම්මුතියකට එළඹීමක් පිළිබඳව හෝ සාකච්ඡා නොකළ බව සඳහන් කරන ලදී.

සේවකයන් අපේක්ෂා කළේ පඩි වැඩි වීම මූලික වැටුපට එකතු කිරීමට වුවද, පාලක පක්ෂය වැඩි වීම් කිසිවක් මූලික වැටුපට එකතු කිරීමට එකඟ නොවුනි. වර්ජනය පවතිද්දී නව සේවකයන් සමාගමට බඳවාගත් බවද සාක්ෂිකරු අවධාරණය කරන ලදී. නඩු විභාගයේදී R15 ලෙස ලකුණු කරන ලද ලේඛනය වර්ජනයට සම්බන්ධ නොවූ සේවකයන් තිස්එක් දෙනෙකුගේ නම් වලින් යුක්ත වූවකි. එම ලේඛනය ලකුණු කිරීමේදී එම ලේඛනය පිළිබඳව දැනුමක්

හෝ අවබෝධයක් ඉල්ලුම්කරුවන්ට නොමැති බවත් එබැවින් එම ලේඛනය සාක්ෂිකරුවන් කැඳවීමේ හා ඔප්පු කිරීමේ භාරයට යටත්ව භාර ගන්නා ලෙස අයැද සිටින ලදී. එසේ නොවුනහොත් ලේඛනය ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලන ලදී.

වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් පන්තියදේවගේ සරත් යන අය සාක්ෂියට කැඳවන ලදී. ඔහු සමාගමේ වසර 19 කට ආසන්න කාලයක් සේවය කළ බවත් මුලදී වෘත්තීය සමිති ක්‍රියාකාරියෙකු ලෙස ක්‍රියා කළ බවත් පසුව එකී තනතුරු වලින් ඉවත් වූ බවත් සඳහන් කරන ලදී. ඔහු තනතුරු වලින් පමණක් නොව සාමාජිකත්වයෙන්ද ඉවත් වූ බව අවධාරණය කරන ලදී. R15 ලේඛනය හතර වන ඡේදයේ,

''ප්‍ර - ප්‍රදේශයේ පවතින වෙනත් කර්මාන්ත ශාලා දෙස බලන විට අපගේ කර්මාන්ත ශාලාව මාසික ඉපයීමට අමතරව බොහෝ වරප්‍රසාද ලැබෙන නිසා ඉතා සතුටින් සේවය කළෙමු කියලා.

පි - ඔව්

ප්‍ර - මොනවද ලැබුනු අමතර වරප්‍රසාද ?

පි - අමතරව මොකුත් නෑ''

ප්‍ර - වැඩ වර්ජනයේ යෙදුන සේවකයන් වැඩ වර්ජනයේ යෙදුන වකවානුවේ තමුන් රැකියාවට ගියා ?

පි - ඔව්

ප්‍ර - තමුන්ලා වැඩට ආවාට ඔවුන්ගෙන් කිසිදු අවහිරයක් උනේ නෑ ?

පි - නෑ

ප්‍ර - ඒ අනුව මෙම ආර් 15 ලේඛනය ඉහත පිළිතුරු වලට පටහැනියි නේද ? වැඩ වර්ජනයේ නොයෙදෙන සේවකයින්ට සේවයට යාමට ඉඩ නොදීමෙන් අපට අපගේ රැකියාව කරගෙන යාමට ඇති අයිතිය කඩා බිඳ දමා ඇත කියන එක ?

පි - එහෙම දෙයක් වුනේ නෑ ඒ අය හිටියේ පාර අයිනේ.

ප්‍ර - සේවයට යාමට ඉඩ නොදුන්නේ නෑ නේද? තමුන් සේවයට ගියා නේද ?

පි - ඔව්

ප්‍ර - මේකේ කියනවා සේවකයන්ට සේවයට යාමට ඉඩ නොදීමෙන් සේවක අයිතිවාසිකම් බින්දා කියලා ? එය තමුන්ගේ සාක්ෂියට පරස්පරයි නේද එම කියමන ?

පි - ඔව්

ප්‍ර - යම් කිසි බලපෑමක් වුනාද ?

පි - අපි රැකියාව ඕන නිසයි කෙලින්ම ගිහිල්ලා අත්සන් කරලා මේක බාර දුන්නේ කොහොමත් බාධක තිබෙනවානේ.

*අධිකරණය :-*

ප්‍ර - වර්ජන වකවානුවේදී වැඩ වර්ජකයින්ගෙන් සේවයට පැමිණෙන සේවකයන්ට යම් බාධාවක් ඇති වුනාද?

පි - නෑ

ප්‍ර - තමන්ගේ උත්තරය අනුව සේවකයන්ට සේවයට යාමට ඉඩ නොදුන්නා කියන කාරණාව වැරදියි නේද ?

පි - (උත්තරයක් නැත)

ඉහත නම් සඳහන් සාක්ෂිකරු හරස් ප්‍රශ්න වලට පිළිතුරු දුන් ආකාරය පිළිබඳ සලකා බලද්දී වැඩ වර්ජකයන්ගෙන් වැඩ වර්ජනය නොකළ අයට කිසිම අවහිරතාවයක් හෝ බාධාවක් සිදු නොකළ බව පැහැදිලිව අනාවරණය විය. වගඋත්තරකාර සමාගම වෙනුවෙන් වඩුවෙල් මර්ගදාස් මහින්ද ප්‍රසාද් නැමැති අය සාක්ෂියට කැඳවන ලද අතර මූලික සාක්ෂි වලදී 1978 සිට මේ දක්වා වගඋත්තරකාර සමාගමේ විදුලි කාර්මික වැඩ කරන බව සඳහන් කරන ලදී. 2015.05.26 වන දින 06 වන පිටුවේ පළවෙනි ප්‍රශ්නය සහ උත්තරය 08 වෙනි පිටුවේ දී,

හතරවෙනි ප්‍ර - සාක්ෂිකරු ඔබ මෙම වගඋත්තරකාර ආයතනයේ 1978 සිට වැඩ කරනවා කියලා කියා සිටියා නේද ?

පිළිතුරු - 1978 තමයි වෘත්තීය ජීවිතය ආරම්භ කළේ 2010 සිට තමයි මෙම වගඋත්තරකාර ආයතනයේ වැඩ කරන්නේ සාක්ෂිකරු පැහැදිලිවම පළමුව 2010 වර්ෂයේ කොරුග්‍රේටඩ් යන්ත්‍රය අලුත් වැඩියාවට ගිය බව ප්‍රකාශ කරන ලදී. කෙසේ වෙතත් සාක්ෂිකරුට නිශ්චිතවම කොරුග්‍රේටඩ් යන්ත්‍රය අලුත් වැඩියා කිරීමට ගිය කාලවකවානුව නිශ්චිතවම කිව නොහැකි විය. ඔහු තම සාක්ෂියෙන් කියා පෑමට උත්සහා කළේ අඟල් 04 ක් පමණ පොළොව යටින් ඇති සිමෙන්ති ආවරණයක් සහිත නළයක් කැඩීමෙන් යන්ත්‍රය ඇණ හිටිය බවත් එය උලකින් ඇනීමකින් සිදුවිය හැකි බවත් ය. වර්ජනය ආරම්භ වූ කාලය සලකා බලද්දී එය 2009 මුල් වකවානුවේ දී සිදු වූ බව දෙපාර්ශ්වයේම සාක්ෂි මත අනාවරණය විය.

වගඋත්තරකාර සමාගම කියා පෑමට උත්සහා කළේ වර්ජකයන් විසින් මෙම කඩාකප්පල්කාරී ක්‍රියාව සිදු කරන ලද බව කියා පෑමටය. කෙසේවෙතත් මෙම සිද්ධිය සම්බන්ධයෙන් මීට ප්‍රථම මෙම සාක්ෂිකරු පොලීසියට හෝ කම්කරු දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් කර නොතිබුණි. එසේම වගඋත්තරකාර සමාගම කිසිම සේවකයෙකුට විරුද්ධව කිසිදු චෝදනාවක් ඉදිරිපත් කර නොතිබුණි. මීළඟට වගඋත්තරකාර පක්ෂය ගලප්පත්තිහේවගේ ප්‍රියන්ත ලක්මාල් යන අය සාක්ෂියට කැඳවූ අතර ඔහු විසින් බොයිලේරු වල සහ ෆොක්ලිෆ්ට් යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සාක්ෂි දුන් අතර ඔහු පැහැදිලිවම ප්‍රකාශ කළේ කොරුග්‍රේටඩ් යන්ත්‍රය ටික කලක් පමණක් අඩපණව තිබුනද පසුව අලුත්වැඩියා කරගත් බව මෙම සාක්ෂිය මඟින් ද හෙළිදරව් විය.

වගඋත්තරකාර පක්ෂයේ මූලික අරමුණ වූයේ වර්ජනය නීති විරෝධී වර්ජනයක් බවත් වර්ජනකයන් විසින් ද්වේශ සහගතව සමාගමේ කටයුතු අඩපණ කිරීමට නීති විරෝධී සහ කඩකප්පල්කාරී ක්‍රියාවන් කළ බවට කියා පෑම වුවද එය පැහැදිලිවම පෙර සූදානමකින් කළ සාක්ෂි බව අනාවරණය විය. පෙර සඳහන් කරන ලද ආකාරයට මේ සිද්ධීන් සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පක්ෂයෙන් හරස් ප්‍රශ්න වලදී කිසිදු අදහසක් මතු නොකළ අතර එකී ක්‍රියාවන් සම්බන්ධයෙන් පෙර සඳහන් කරන ලද කොළඹ මහේස්ත්‍රාත් නඩුවේ චෝදනාවන්ට අමතරව ග්‍රාම නිලධාරිවරයා ඉදිරියේ, කම්කරු කොමසාරිස්වරයා ඉදිරියේ හෝ පොලීසියේ දීවත් හෝ කිසිම පැමිණිල්ලක් නොකළා පමණක් නොව සාක්ෂිකරුවන්ගෙන් ප්‍රකාශයක් ද සටහන් කරගෙන නැත.

ඉහත සියලු කාරණා සමස්තව සලකා බලද්දී ඉල්ලුම්කරුවන් විසින් නීත්‍යානුකූලව අරඹන ලද වැඩ වර්ජනය වගඋත්තරකාර සමාගමේ ක්‍රියාවන් නිසා කඩාකප්පල් වූ බවත් පසුව එය සාධාරණීයකරණය කිරීමට නැවත සේවයට පැමිණෙන ලෙස දන්වා

ලිපි යවා නොපැමිණි පදනම මත සිය කැමැත්තෙන් සේවය හැර ගියේ යන පදනම මත සේවකයන්ගේ රැකියා අහිමි කළ බව ඉතා පැහැදිලිය. සාක්ෂි අතරතුර දී සේවකයන් වර්ජනය කළ නිසා නිෂ්පාදනය වැඩි කර ගැනීමට අමතර සේවකයන් බඳවා ගත් බවත් ඔවුන් තවමත් සේවයේ යෙදී සිටින බවත් අනාවරනය විය. වර්ජනය නිසා නිෂ්පාදනය පහළ බැසීම හේතුකොටගෙන සමාගම ආර්ථික හා මූල්‍යමය දුෂ්කරතා වලට මුහුණ පෑ බවද අවධාරණය කරන්නට විය.

ඉහත කරුණු මත ඉල්ලුම්කරුවන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ගය නීත්‍යානුකූල බවට නිගමනය කරමි.

*ප්‍රදානය :-*

1. සියලුම වැඩ වර්ජකයන් නීත්‍යානුකූලව වැඩ වර්ජනය කරන ලද බැවින් සියලුම දෙනා යළි සේවයේ පිහිටුවීමට වගඋත්තරකාර පක්ෂයට නියම කරමි.
2. ඉල්ලුම්කරුවන්ගේ සේවය අහිමි කළ දවසේ සිට යළි සේවයේ පිහිටුවීම දිනය දක්වා සම්පූර්ණ හිඟ වැටුප් ගෙවීමට වගඋත්තරකාර පක්ෂයට නියම කරමි.
3. වගඋත්තරකාර පක්ෂය සේවකයන්ගේ සේවය අහිමි කිරීම අයුක්ති සහගත සහ අසාධාරණ ක්‍රියාවක් බැවින් ඉහත සඳහන් ප්‍රදානයන් කිරීම සාධාරණ සහ යුක්ති සහගත නියමයක් ලෙස ප්‍රකාශ කරමි.
4. මෙකී ප්‍රදානයන් ගැසට් පත්‍රයේ පළ වූ දින සිට මසක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු ය. මුදල් නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කර්යාලයේ තැන්පත් කළ යුතු ය.

*සටහන*

මෙම බේරුම්කරණ විභාගයට සෑහෙන කාලයක් ගත වූයේ දෙපාර්ශ්වයම වරින් වර දින ඉල්ලා කරන ලද ඉල්ලීම් වල ප්‍රතිඵලයක් හැටියටය. විශේෂයෙන්ම මෙම ප්‍රදානය සකස් කොට ඉදිරිපත් කිරීම ප්‍රමාද වූයේ නොවැළැක්විය හැකි අති පෞද්ගලික හේතුන් නිසා බවත් ඒ සම්බන්ධයෙන් දෙපාර්ශවයට ම කිසියම් අපහසුතාවයක් වූයේ නම් පෞද්ගලිකව අතිශයින්ම කණගාටුවට පත් වෙමි.

එස්. එම්. එස්. ජයවර්ධන,
බේරුම්කරු.

වර්ෂ 2017 ක් වූ ඔක්තෝබර් මස 25 වැනි දින,
කාර්මික අධිකරණයේ දීය.

02 - 763

---

*මගේ අංක :* IR/15/28/2011

## කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.07.03 දිනැති හා අංක 1817/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.04.30 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දන්තුරේ, සියඹලාගොඩ, අංක 373හි පිහිටි එස්. එස්. කේ. එස්. විජේවර්ධන මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොලොන්නාව, නිමාව හි පිහිටි සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.10.20 දිනැති ප්‍රදනය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්

2018 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංක :* IR/15/28/2011

### කාර්මික අධිකරණයේ දී ය

එස්. එස්. කේ. එස්. විජේවර්ධන මහතා,
අංක 373,
සියඹලාගොඩ,
දන්තුරේ.

නඩු අංකය : A3513 *පළමු පාර්ශවය*

*සහ*

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ්,
ටර්මිනල්ස් ලිමිටඩ්,
නිමාව,
කොලොන්නාව.

*දෙවන පාර්ශවය*

*අතර පවතින ආරාවුල*

### ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියැවෙන) දරන පනත් වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2013.04.30 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරවුලට හේතු වී ඇති කාරණය :-

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ ;

''එස්. එස්. කේ. එස්. විජේවර්ධන මහතා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්හි වසර 16ක පමණ කාලයක් උසස් වීම් නොලබා සේවය කිරීම හේතුවෙන් ඔහුට අසාධාරණයක් සිදු වී ඇත් ද ? එසේ අසාධාරණයක් සිදු වී ඇත්නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද'' ? යන්න ය.

පෙනී සිටීම

මෙම නඩුවේ පළමුවැනි පාර්ශවය ලෙස තමාට අසාධාරණයක් සිදුවී යයි පවසමින් සහනයක් පතන එස්. එස්. කේ. එස්. විජේවර්ධන මහතා නඩු කටයුත්ත පුරාම ඊට සහභාගී විය. ආරම්භයේ දී මූලික ප්‍රකාශය සහ දෙවැනි ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ පටන් බේරුම්කරණය

විභාගය අවසන් වන දින තෙක් නඩු වාර කීපයක දී හැරුණු විට පළමුවැනි පාර්ශවය වෙනුවෙන් පෙනී සිටියේ නීතිඥ සුසන්ත ගුණසේකර මහතා ය.

දෙවැනි පාර්ශවයේ ආයතනය වෙනුවෙන් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ උසාවි ලිපිකරු සරත් කරුණාරත්න මහතාත්, ලිපිකරු එච්. එම්. අයි. හිඳගොල්ල මහතාත් වරින් වර පෙනී සිට ඇත. දෙවැනි පාර්ශවය වෙනුවෙන් නඩුව ආරම්භ කළ කාලයේ පෙනී සිටියේ නීතිඥ එල්. ඩබ්ලිව්. ගුණසේකර මහතා ය. පසුව ආයතනයේ නීති නිලධාරිනි අනුරාධා ජයවර්ධන මහත්මිය දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටියා ය.

නඩු පටිපාටිය

මෙම නඩුව 2013.09.16 දින පළමු වතාවට කැඳවනු ලැබුණි. පළමු සහ දෙවැනි ප්‍රකාශයන් පාර්ශ්වයන් දෙකට ම හුවමාරු කර භාරදෙනු ලැබ, ඒවා ද සැලකිල්ලට ගෙන විභාගයකට අවතීර්ණ නොවී දෙපාර්ශ්වයේ එකඟතාව මත කිසියම් සාධාරණ සමථයකට එළඹිය හැකි ද යන්න පිළිබඳ දැඩි උත්සාහයක් ගන්නා ලදී. එබඳු සමථයකට දෙපාර්ශ්වය ගෙන ඒම අපහසුවූයෙන් විභාගය ඇරඹුණි. නඩුව 2013 සැප්තැම්බර් මස 16, දෙසැම්බර් මස 17, 2014 ජනවාරි 06, පෙබරවාරි 13, මැයි 05, ජුනි 13, සැප්තැම්බර් 18, ඔක්තෝබර් 09, 2015 පෙබරවාරි 02, අප්‍රේල් 29, මැයි 18, ජුනි 22, ජූලි 16 යන දිනයන් 13කට කැඳවා විභාගය පවත්වන ලදී. දින නියම කරන ලද නමුත් 2013 පෙබරවාරි 28, මැයි 23, ජූලි 03, ඔක්තෝබර් 27, 2015 පෙබරවාරි 16 යන දිනයන් 04හි දී පරීක්ෂණය විභාගය නොපැවැත්විණි.

මෙම බේරුම්කරණය විභාගයේ දීර්ඝ සාක්ෂි විභාගයන් පැවැත්වුනේ 2014.02.13, 2014.06.13 සහ 2014.09.18 යන දින තුනෙහි දී පමණක් වීම ඉතා වැදගත් කරුණකි. එහි දී කෙරුණේ ඉල්ලුම්කරු විජේවර්ධන මහතාගේ සාක්ෂිය මෙහෙයවීම පමණි. බේරුම්කරණ විභාගයේ දී ඉතා වැඩි කාලයක් මිඩංගු කරනු ලැබුවේ පරීක්ෂණය ඉදිරියට පවත්වාගෙන යාමට අගතියක් නොවන පරිදි දෙපාර්ශවය එකඟ වන කිසියම් සමථයක් සඳහා එළඹීමට ඇති හැකියාව සළකා බැලීමටයි.

සමථ වෑයම සාර්ථක වීම :

මෙම බේරුම්කරණ නඩු නිමිත්ත මීට පෙර මානව හිමිකම් කොමිෂන් සභාවේ දී ද විභාගයට ගෙන තීන්දුවක් දී ඇතත් ක්‍රියාත්මක නොවූ කරුණකි. ඉල්ලුම්කාර සේවක මහතා දැනටමත් ආයතනයේ සේවය කරමින් සිටින බැවින් ද, බැලූ බැලුමට ඉල්ලුම්කරුට යම් සහනයක් ලබා දීම යෝග්‍ය බව පෙනෙන්නට තිබුණු බැවින් ද, පාලනාධිකාරිය සමග සාකච්ඡා කොට ඉල්ලුම්කරු ද විමසා යම් සමථයකට පත් වීමේ හැකියාවක් සඳහා වෑයමක් දරන ලෙස දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නියෝජිතයන්ගෙන් සහ ආයතනයේ සේවය කරන නීති නිලධාරීන්ගේ අවධානයට මා විසින් දිගින් දිගට ම ලක් කරන ලදී.

එකී නීති නිලධාරීන් විසින් පාලනාධිකාරියට කරන ලද කරුණු දැක්වීම් ද, ඉල්ලුම්කරු පාලනාධිකාරිය සමග සුහද සාකච්ඡා කීපයක් පැවැත්වීම ද හේතු කොට ගෙන 2015.02.02 දින බේරුම් කරණ විභාගය ආරම්භයේ දී ම ආයතනය වෙනුවෙන් පෙනී සිටි නීති නිලධාරී දැනුම් දුන්නේ ඒ වන විට පාලනාධිකාරිය මෙම ආරවුල සමථයකින් විසඳගැනීමට සුභවාදී ව උත්සාහ ගන්නා බවයි. ඒ නිසා එදිනෙන් පසුව සාක්ෂි විභාගයක් සිදු වුනේ නැත. 2015 අප්‍රේල් 29, මැයි 18, ජුනි 22 යන දිනයන්හිදී මෙම අපේක්ෂිත සමථය පිළිබඳව පුළුල් වශයෙන් දෙපාර්ශවය සමග සාකච්ඡා කරන ලදී. ඒ අනුව 2015 ජූනි 16 දින දෙපාර්ශ්වය සෑහීමකට පත් වූ විසඳනාවන් ඉදිරිපත් කරන ලදින් එකඟතාවකින් ආරවුල් සමථයකට පත් කෙරුණි.

එකී එකඟතාවන් පදනම්කරගෙන පහත දැක්වෙන ප්‍රදානය පිරිනමමි.

ප්‍රදානය

1. පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරු වන එස්. එස්. කේ. එස්. විජේවර්ධන මහතා මේ වන විට සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්හි දරමින් සිට තනතුර වන බීV ශ්‍රේණියේ ආරක්ෂක සහකාර තනතුරේ සිට බීIII ආරක්ෂක අධික්ෂක තනතුරු ඉක්මවා, ඊට ඉහළින් පවත්නා තනතුර වන බීII ආරක්ෂක නිලධාරී තනතුරට වහාම ක්‍රියාත්මක වන පරිදි උසස් කිරීම.

2. එස්. එස්. කේ. එස්. විජේවර්ධන මහතාට බීII ආරක්ෂක නිලධාරී තනතුරට ලබා දෙන එකී උසස් වීම් 2005.06.15 සිට බලපැවැත්වෙන සේ පෙරදතම් කිරීම.

3. එස්. එස්. කේ. එස්. විජේවර්ධන මහතාට ලබා දෙන එකී උසස් වීම සමග 2005.06.15 දින සිට බලපැවැත්වෙන සේ වැටුප් වර්ධක වාසි ලබා දීම.

4. එස්. එස්. කේ. එස්. විජේවර්ධන මහතාට නියමිත වැටුප් වර්ධක පැවරීමෙන් වැටුප් පරිමාණයේ නිසි වැටුප් පියවරෙහි පිහිටුවීම.

5. ඉහත අංක 1, 2, 3 හා 4හි සඳහන් වන පරිදි උසස් වීම් ලබා දීම, පෙරදතම් කිරීම සහ වැටුප් වර්ධක වාසි ලබා දීම කරනු ලැබුවත් 2005.06.15 දින සිට 2015 ජූලි මාසය දක්වා කාලයට කිසිදු හිඟ වැටුප් ප්‍රතිලාභයක් එස්. එස්. කේ. එස්. විජේවර්ධන මහතාට ලබා නොදීම.

පරීක්ෂණය පැවැත්වූ අවසන් දිනය වන විටත් මෙම සහනයක් සාකච්ඡා මාර්ගයෙන් ඉල්ලුම් කරුට ලබා දෙන ලෙස ආයතනය නියෝජනය කළ නීති නිලධාරීට දැනුම් දෙන ලද අතර ඒ සම්බන්ධයෙන් ආයතනය වෙනුවෙන් ඇය එකඟත්වය පළ කිරීමේ හේතුවෙන් කාර්මික ආරවුල විසඳා අවසන් කරන ලදී.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු.

2017.10.20 දින කාර්මික අධිකරණයේ දී ය.

02-764

---

මගේ අංක : IR/20/28/2010

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.10.28 දිනැති හා අංක 1729/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2011.10.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 10, ආනන්ද රාජකරුණා මාවත, අංක 141හි පිහිටි නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 07, ජාවත්ත පාර, අංක 93හි පිහිටි නැෂනල් පේපර් කම්පැනි ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන

ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.09.10 දිනැති ප්‍රදනය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්

2018 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය* : IR/20/28/2010

කාර්මික අධිකරණයේ දී ය

නිදහස් වෙළඳ කලාප සහ පොදු
සේවා සේවක සංගමය,
අංක 141, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

නඩු අංකය A3415 *පළමු පාර්ශවය*

*සහ*

නැෂනල් පේපර් කම්පැනි ලිමිටඩ්,
අංක 93, ජාවත්ත පාර,
කොළඹ 07.

*දෙවන පාර්ශවය*

*අතර පවතින ආරවුල*

## ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියැවෙන) දරන පනත් වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2011.10.20 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරවුලට හේතු වී ඇති කාරණය :-

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :-

''නැෂනල් පේපර් කම්පැනි ලිමිටඩ් ආයතනයට අයත් වාලච්චේන කඩදසි කර්මාන්ත ශාලාවේ ඉංජිනේරු ජී. එල්. ජොන්සන් මහතා සම්බන්ධයෙන් පවත්වන ලද විනය පරීක්ෂණයේ පරීක්ෂක නිලධාරියාගේ නිර්දේශ ඉක්මවා ඔහුට ලබා දෙන ලද දඬුවම් සාධාරණ ද යන්න හා එසේ නොවන්නේ නම් හා ඔහුට අගතියක් වුයේ නම් හිමි විය යුතු සහනයක් කවරේද යන්න පිළිබඳව වේ.''

පෙනී සිටීම

මෙම නඩුවේ පළමුවැනි පාර්ශවය ලෙස ස්වකීය සාමාජිකයෙකු වූ ජී. එල්. ජොන්සන් මහතාට අසාධාරණයක් සිදුවී යයි පවසමින් ඔහු වෙනුවෙන් සහනයක් පතන නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය හෝ එකී සේවක මහතා නඩු කටයුත්තේ කිසි ම දිනෙක ඊට සහභාගී නොවී ය. පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් කිසිදු නියෝජිතයෙකු හෝ ඉල්ලුම්කරු වෙනුවෙන් බලය පවරන ලද නීතිඥවරයෙකු කිසි දිනෙක හෝ පෙනී සිටියේ නැත.

මෙම බේරුම්කරණ විභාගය විභාගයට ගන්නා ලද දින තුනෙහි දී ම දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් නියෝජනයක් සිදු විය.

නඩු පටිපාටිය

බේරුම්කරණ විභාග පටිපාටිය අනුව පළමුවන සහ දෙවන පාර්ශ්වයන්ට තම ස්ථාවරය දක්වෙන පළමුවැනි ප්‍රකාශය 2011.11.18 වැනි දින හෝ ඊට පෙර ඉදිරිපත් කරන ලෙස කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී විසින් දැනුම් දී ඇත. අපේක්ෂිත පළමු ප්‍රකාශය ප්‍රමාද වී වුව ද ලබා දී ඇත්තේ දෙවන පාර්ශ්වය වන වගඋත්තරකාර ආයතනය විසින් පමණි. පළමුවැනි පාර්ශ්වය විසින් අපේක්ෂිත ලිඛිත ප්‍රකාශ කිසිවක් ලබා දී නැත.

මෙම පසුතලය යටතේ වුව ද බේරුම්කරණ විභාගය 2012.03.15 දින පැවැත්වීමට පළමු වතාවට කැඳවනු ලැබුණි.

එදින බේරුම්කරණ විභාගයට පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරු පෙනී සිටියේ නැත. එදින පරීක්ෂණයට තමා සහභාගී නොවන බව දන්වා කිසිදු ලිපියක් වත්, දුරකථන පණිවුඩයක් වත් එවා නැත. ඉල්ලුම්කාර සමිතිය වෙනුවෙන් නියෝජිතයෙකු හෝ නීතිඥ වරයෙකු වත් එදින පෙනී සිටියේ නැත. දෙවන පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් එහි පුහුණු පරිපාලන නිලධාරී බී. කේ. ආර්. එස්. ප්‍රනාන්දු මහතා පැමිණ සිටියේ ය.

එබැවින් පරීක්ෂණය 2012.04.19 දින පැවැත්වීමට දින නියම කොට කල් තබන ලදී.

දෙවැනි දිනය වූ 2012.04.19 දින දී ද පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කාර සමිතිය පෙනී සිටියේ නැත. එදින පරීක්ෂණයට සහභාගී වන නොවන බව දන්වා කිසිදු ලිපියක් වත්, දුරකතන පණිවුඩයක් වත් එවා නැත. ඉල්ලුම්කාර සමිතිය වෙනුවෙන් නියෝජිතයෙකු හෝ නිතිඥ වරයෙකු වත් එදින පෙනී සිටියේ නැත. දෙවන පාර්ශවයේ ආයතනය වෙනුවෙන් කම්කරු උපදේශක ඒ. ඉමදුව මහතා සමග නැෂනල් පේපර් කම්පැනි ලිමිටඩ්හි විධානය පිරිස් පාලන විනිතා ප්‍රේමචන්ද්‍ර මහත්මිය පැමිණියා ය. එදින ද ආයතනය වෙනුවෙන් නීතිඥ චන්ද්‍රා ගුණතිලක මහතාගේ උපදෙස් මත නීතිඥ නිලුක ගුණතිලක මහතා පෙනී සිටියේ ය.

එබැවින් පරීක්ෂණය 2012.05.17 දින පැවැත්වීමට දින නියම කොට අවසන් නිවේදනයක් යැවීමට තීරණය කොට විභාගය කල් තබන ලදී.

තුන් වන දිනය වූ 2012.05.17 දින දී ද පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලම්කාර සමිතිය පෙනී සිටියේ නැත. එදින පරීක්ෂණයට සහභාගී වන නොවන බව දන්වා කිසිදු ලිපියක් වත්, දුරකථන පණිවුඩයක් වත් ඒවා නැත. ඉල්ලුම්කාර සමිතිය වෙනුවෙන් නියෝජිතයෙකු හෝ නීතිඥ වරයෙකු වත් එදින පෙනී සිටියේ නැත. දෙවන පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් කම්කරු උපදේශක ඒ ඉමදුම පැමිණියේ ය. එදින ද ආයතනය වෙනුවෙන් නීතිඥ චන්ද්‍රා ගුණතිලක මහතාගේ උපදෙස් මත නීතිඥ නිලුක ගුණතිලක මහතා පෙනී සිටියේ ය.

ඒ අනුව එදින මම මෙසේ තීරණයක් සටහන් කර තැබුවෙමි.

''............ඉහත කරුණු සැලකිල්ලට ගත් කළ පැමිණිලිකරුට මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් උනන්දුවක් ඇති බවක් නොපෙනේ. එහෙයින් මෙම නඩුව තවදුරටත් පවත්වාගෙන යාම අර්ථයක් ඇතැයි නොසිතමි. එසේ හෙයින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා කොට මෙම නඩුවේ කටයුතු අවසන් කිරීමට මම තීරණය කරමි.''

යනුවෙනි

එකී තීරණය දීමෙන් පසුව, ඉල්ලුම්කාර නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමයේ සම ලේකම් වරයා 2012.05.17 දතමින් කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරි වරයා අමත එවන ලද ලිපියක් 2012.05.22 දින ලැබිණි. කාර්මික ආරවුලට සම්බන්ධ සේවකයා වන ජී. එල්. ජොන්සන් මහතාගේ සේවය අවසන් කිරිම සම්බන්ධයෙන් නඩු අංක LT/BT/205/2011 දරන නඩුව මඩකලපුව කම්කරු විනිශ්චය සභාවේ පැමිණිලි කොට විභාග වෙමින් පවතින බැවින් කාර්මික අධිකරණයේ පැවැත්වෙන මෙම බේරුම්කරණ විභාගයට පැමිණිලි පාර්ශ්වය සහභාගී නොවන බව එකී ලිපියේ සඳහන් වේ.

එම නිසා ඉහතින් දක්වා ඇති බේරුම්කරණය සඳහා වන යොමු කිරීම සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කිරීම මෙයින් අවසන් කරමි.

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියැවෙන) දරන පනත් වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2011.10.20 දිනැති නියෝගයෙන් මා වෙත යොමුකර ඇති යොමුව සම්බන්ධයෙන් වන කාර්මික ආරවුලට අදාල නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය විසින් කර තිබුණු.

ඉල්ලීම නිශ්ප්‍රභා කරමි.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු.

2017 සැප්තැම්බර් මස 10 දින,
කාර්මික අධිකරණයේ දී ය.

02-765